කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය- භූගෝල විද්‍යාව

ශ්‍රේණිය -13

සකස් කළ ගුරුභවතාගේ නම - එන්.එම්.එම්.දමයන්ති මිය

පාසල - ර/එරත්න ම.වි.

පාඩම - 10

## ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය

1.) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් නම් කළ ප්‍රධාන සංචාරක කලාපයක් නොවන්නේ,

1. කොළඹ නගරය
2. දකුණු වෙරළ
3. උතුරු ප්‍රදේශය
4. උඩවලව
5. උස්බිම් ප්‍රදේශය

2.) 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් පිරිසක් පැමිණි රටවල් 3 අනුපිළිවෙලින් දැක් වූ විට,

1. ඉන්දියාව,එක්සත් රාජධානිය,ජර්මනිය වේ.
2. ජර්මනිය,ඉන්දියාව,චීනය වේ.
3. එක්සත් රාජධානිය,ඉන්දියාව,ජර්මනිය වේ.
4. ඉන්දියාව,එක්සත් රාජධානිය,චීනය වේ.
5. ජපානය,ඉන්දියාව,චීනය වේ.

3.) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්ධනයට බලපෑ මානව ජන්‍ය පදනමට අයත් වූවක් නොවන්නේ,

1. පුරාවිද්‍යා ස්ථාන
2. කලා ශිල්ප
3. දර්ශනීය ස්ථාන
4. ජනශ්‍රැති
5. දේශීය වෛද්‍ය සේවා

4.) 2014 වර්ෂයේදී වැඩිම සංචාරකයින් පිරිසක් මෙරටට පැමිණ ඇත්තේ,

1. විවේකය හා විනෝදය සඳහාය.

2. නැදෑ හිතවතුන් බැලීම සඳහාය.
3. ව්‍යාපාර කටයුතු සඳහාය.
4. වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහාය.
5. ක්‍රීඩා තරඟ නැරඹීම සඳහාය.

5.) පැසිපික් ආසියා සංචාරක සංගමයේ මූලස්ථානය පිහිටා ඇත්තේ,

1. මැඩ්රිඩ් නගරයේය.
2. කත්මණ්ඩු නගරයේය.
3. හොනලුලු නගරයේය.
4. ටෝකියෝ නගරයේය.
5. නවදිල්ලි නගරයේය.

6.) වික්‍රමයන් ආශ්‍රිත සංචරණයට අයත් වන්නේ,

1. දළ කඳු බැවුම් තරණය
2. දිය මත ලිස්සා යාම ය.
3. පුරාණ නගර නැරඹීමට යාම ය.
4. කඳුකර ප්‍රදේශ නැරඹීමට යාම ය.
5. අභයභූමි නැරඹීමට යාම ය.

7.) සංචාරක කර්මාන්තය නිසා සමාජ සංස්කෘතික වශයෙන් ඇත්වන යහපත් බලපෑමකි,

1. ශ්‍රී ලාංකිකයන් විදේශ භාෂා ඉගෙනීමට පෙළඹීම.
2. ආගමික හා සංස්කෘතික වටිනාකමක් ඇති භාණ්ඩ පිටරටට ඇදී යාම.
3. සත්ව හා ශාක කොටස් පිටරටට ගෙන යාම.
4. ඇතැම් සංචාරකයන් දේශීය හා ආගමික වත් පිළිවෙත් අනුගමනය නොකිරීම.
5. සෘජු හා වක්‍ර රැකියා අවස්ථා වැඩිවීම.

8.) සංචාරක කර්මාන්තයේ වර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

1. විවිධ රටවල ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. සංචාරකයන්ගේ ආරක්ෂාව සඳහා දැඩි නීති රීති ක්‍රියාත්මක කිරීම.
3. සංචාරක වීසා නිකුත් කිරීමේදී වඩාත් නම්‍යශීලී ප්‍රතිපත්තිවලට නැඹුරු වීම.
4. විදේශීය අයහපත් ගති සිරිත් අනුගමනය කිරීමට පෙළඹීම.
5. සංචාරකයන් මෙහි ගත කරන කාලය ප්‍රසන්නව ගත කිරීමට අවස්ථාව සැලසීම.

9.) සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ඇතිවන ආර්ථික බලපෑමක් නොවන්නේ,

1. සංචාරකයින් පැමිණීම බොහෝ දුරට එක් කාලයකට පමණක් සීමා වීමය.
2. බහුජාතික සමාගම්වල අනිසි බලපෑම්ය.
3. දේශීය භාණ්ඩ මිළ ඉහළ යාම නිසා පාරිභෝගිකයන්ට ගැටළු ඇති වීමය.
4. මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවීමය.
5. විවිධ සේවා සැපයීමෙන් මෙම ප්‍රදේශවල ජනතාවගේ ආදායම ඉහළ යාමය.

10.) සංචාරක කර්මාන්තය ආශ්‍රිතව පාරිසරික බලපෑම්වලට අයත් නොවන්නේ,

1. භූමිය,ජලය,ශාක හා සතුන් ආරක්ෂා කිරීම සඳහා විදේශාධාර ලැබීමය.
2. වෙරළ සංරක්ෂණය
3. අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම සම්බන්ධ ගැටළු ඇතිවීමය.
4. ළමා අපචාර බහුල වීමය.
5. සත්ව හා ශාක කොටස් පිටරටවලට ගෙන යාමය.

**<u>පිළිතුරු පත්‍රිකාව</u>**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 4 | 6 | 1 |
| 2 | 4 | 7 | 1 |
| 3 | 3 | 8 | 4 |
| 4 | 1 | 9 | 4 |
| 5 | 3 | 10 | 4 |